**B**

# නිවේදනය

ඇතැම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් රජයේ විවිධ උසස් නිලතල හොබවන නිලධාරින් සම්බන්ධව කිසිදු පදනමකින් තොරව සහ තහවුරු කළ නොහැකි කරුණු මත තම පෞද්ගලික අවශ්‍යතාවන් වෙනුවෙන් ඔවුන්ගේ රාජකාරි තීරණ සහ කටයුතු දෝෂ දර්ශනයට ලක් කරමින් මෙම උත්තරීතර සභාව තුළ විවිධ අවස්ථාවලදී විවේචනය කිරීමේ ප්‍රවණතාවයක් මෑතක සිට වර්ධනය වෙමින් පවතින බව ගරු මන්ත්‍රීවරයන්ගේ අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

මෙලෙස බොහෝ අවස්ථාවලදී පදනම් විරහිතව සිදු කරනු ලබන එවැනි ප්‍රකාශ මඟින් එකී රාජ්‍ය නිලධාරින්ගේ කීර්තිනාමයට හා වෘත්තීය ගරුත්වයට හානි සිදුවන අතරම එවැනි ප්‍රකාශ සම්බන්ධව පිළිතුරු ලබාදීමේ අවකාශයක් ද එම නිලධාරින්ට නොමැති බැවින් ඔවුන්ට බලවත් අසාධාරණයක් සහ අධෛර්යමත් වීමක් සිදුවන බව නිරීක්ෂණය කරමි.

තවද එවැනි ප්‍රකාශ සිදු කිරීම් සම්බන්ධයෙන් එම නිලධාරින් විසින් මා වෙත තම දැඩි කනස්සල්ල පළ කරමින් ලිඛිතව කරුණු ඉදිරිපත් කිරීමද කර ඇති බව මෙහිලා විශේෂයෙන් සඳහන් කරමි.

රාජ්‍ය නිලධාරින් සම්බන්ධව විවේචන තිබේ නම්, එකී නිලධාරින් පාර්ලිමේන්තුව ඉදිරියට කැඳවා ඒ සම්බන්ධ කරුණු විමසීමට හා අවශ්‍ය පියවර ගැනීමට අවකාශය පවතින බැවින් එලෙස මෙම සභාව තුළදී පදනම් විරහිත චෝදනා එල්ල කරමින් ඔවුන්ව දෝෂාරෝපණයට ලක් කිරීමෙන් වැළකී සිටින ලෙස ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් අවධාරණය කිරීමට කැමැත්තෙමි.

තවද, ස්ථාවර නියෝග 91(උ) හි විධිවිධාන අනුව එවැනි අපහාසාත්මක හෝ අනිසි ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට ද කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් දැනුම්දීමට කැමැත්තෙමි.